# මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ ඓතිහාසික සම්භවයේ පසුබිම

ආචාර්ය විජුවර් විරසිංහ

මාක්ස්වාදී සමාජ දර්ශනයේ සමස්ත න්‍යායික සංකල්පීය සන්දර්භයෙන් මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය වෙන් කළ නොහැකිය. දර්ශනවාදයේ න්‍යායික සහ සංකල්පීය විග්‍රහයේ ඓතිහාසික විකාශනය සමගම ජනමාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පයේ හැඩගැස්ම ද එකවර සිදුවී ඇති බව පෙනේ. එම නිසා ජනමාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පයේ ඓතිහාසික සම්භවයත් එහි සමකාලීන සහ අනාගත සංවර්ධනයත් මාක්ස්වාදී දර්ශනයේ සංවර්ධනය සමග සමස්තයක් වශයෙන් සම්බන්ධ කොට සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

මාක්ස්වාදී ජනමාධ්‍යවේද න්‍යායේ සම්භවයට නිශ්චිත කොන්දේසි අවශ්‍ය විය. එම න්‍යාය ඕනෑම කාලයක හා ඕනෑම ස්ථානයක බිහිවීමට හැකියාවක් නොවීය. එය ඓතිහාසික ප්‍රපංචයක් වශයෙන් සඳහන් කළ හැකිය. එය සමාජ සංවර්ධනයේ නිශ්චිත සංවර්ධිත මට්ටමක් සමග සම්බන්ධ වන්නේ ය. ඉන් මානව ඉතිහාසයේ සංවර්ධනයේ නිශ්චිත අවධියක් නියෝජනය වන්නේය. මාක්ස්වාදී ජනමාධ්‍යවේදී න්‍යායේ සම්භවය සහ විකාශනය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධිත හේතු සාධක රාශියක ප්‍රතිඵලයකි. එම න්‍යායේ බිහිවීම නිශ්චිත හේතු සාධක සංකීර්ණයක ප්‍රතිඵලයකි.

මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය බිහිවීම සහ හැඩගැසීමට බලපෑ මූලිකතම පූර්ව කොන්දේසි වන්නේ සමාජය නිශ්චිත සංවර්ධන මට්ටමකට ලඟා වී තිබීමය. සමාජ පංති හා පංති අරගලය සිදුවීමට අවශ්‍ය තරම් ඉහළ මට්ටමක පැවතීම ඉන් අදහස් වේ. එනම් ධනේශ්වර පංතිය සහ කම්කරු පංතිය අතර සමාජ ආර්ථික ප්‍රතිවිරෝධතා තියුණු වීම සහ විප්ලවීය හා කම්කරු ව්‍යාපාරයේ ප්‍රමාණවත් වර්ධනය

[1] කාල් මාක්ස් ෆෙඩ්රික් එංගල්ස් එකතු කළ කෘතීන් කාණ්ඩ අංක 21, පිටුව 442



මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය බිහිවීමේ ලා අවශ්‍ය වූ පූර්ව කොන්දේසි දිම ලෙස ඇල්ලිය හැකිය. "ප්‍රාග්ධනය මගින් පීඩනයට ඉදිරිපත් කරන ලද ගැටලුවලට පිළිතුරු දීම තුළ මාක්ස්ගේ මහා පරාක්‍රමය වන්නේය"

19 සියවස තුළ යුරෝපා මහද්වීපයේ විශාල රටවල නිෂ්පාදන බලවේගවල දැවැන්ත සංවර්ධනය ධනවාදයේ ශීඝ්‍ර වර්ධනයට හේතු විය. ආර්ථිකය ජීවිතය තුළ වර්ධනය වූ කර්මාන්ත සහ ඉතිහාස ධනේශ්වර පංතියට මෙම නිය දේශපාලන ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා විශාල අවකාශයක් විවෘත කළේය. එය ධනවාදී සංවර්ධනයට හරස් වූ සියලු බාධක විනාශ කිරීමට සමත් විය. යුරෝපය තුළ නව ධනේශ්වර විප්ලව ඇතිවීමට අවශ්‍ය කොන්දේසි බලපෑවේ එංගලන්තය හා ප්‍රංශයට පමණක් නොව තවමත් ගොවිතැන් වැඩවසම්වාදී පදනමක පසු වූ ජර්මනියට ද මෙය බලපෑවේය. 1830 දී ප්‍රංශයේ ඇති වූ ජූලි විප්ලවය රට තුළ මුලා ධනේශ්වර ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා ඉවහල් විය. මෙහි සාර්ථක ප්‍රතිඵලවල බලපෑමෙන් අවදි වූ සෙසු යුරෝපීය රටවල් ධනේශ්වර ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේය.

නිදර්ශනයක් වශයෙන් ජර්මානු ධනේශ්වර අන්තගාමිත්වය රාජාණ්ඩුවේ බලය, සීමා කිරීම, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම, ධනේශ්වර පංතිය රටේ පාලනයට සහභාගී කර ගැනීම ආදී ඉල්ලීම් ඉදිරිපත් කළේය.

සමාජ පංතියක් වශයෙන් ධනපති පංතියේ හැඩගැසීමත් සමගම එහි ප්‍රතිවිරුද්ධ සමාජ පංතිය වන නිර්ධන පංතිය ද බිහිවීම සිදුවිය. මහා පරිමාණ යාන්ත්‍රික නිෂ්පාදනය මගින් කම්කරුවෝ විශාල වශයෙන් නිෂ්පාදන ආයතන තුළට සංකේන්ද්‍රණය වීමට තුඩු දුන්නේ ය. ධනේශ්වර සූරාකෑම උත්සන්න වූ අතර එය ඔවුන් තුළ එකාබද්ධ වීමට හා ඔවුන්ගේ පංති විඥානය වර්ධනය වීමට ආධාරක විය.

සමාජයීය සහ පංතිමය ප්‍රතිවිරෝධතා තියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය දේශපාලනීක වාතාවරණය උණුසුම් විය. 1825 සිට කාලානුරූපව ඇතිවූ ආර්ථික අර්බුද යුරෝපීය රටවල ආර්ථිකයට ප්‍රබල තර්ජනයක් එල්ල කළ අතර කම්කරු පංතියේ තත්ත්වය ද දැඩි ලෙස අයහපත් අතට යොමු කළේය. මේ අර්බුදාත්මක තත්ත්වයෙන් මිදීම සඳහා කම්කරු පංතිය විප්ලවීය මාර්ග කෙරෙහි යොමු වන්නට විය. මුලින්ම මීට ප්‍රතිචාර වශයෙන් විශාල කම්කරු පිරිස් යන්ත්‍ර සූත්‍රවලට එරෙහිව අරගල කළේ ඔවුන්ගේ දරිද්‍රතාවට හේතුව යන්ත්‍ර සූත්‍ර තුළ දුටු නිසාය. 1831 හා 1834 වර්ෂවල ප්‍රංශයේ ලියොන් නගරයේ සිදුවූ කම්කරු අරගලවල මූලික සටන් පාඨය වූයේ "ජීවත් වෙමින් වැඩකරනවාද නොඑසේනම් සටන් කරමින් මිය යන්නේ ද" යන්නයි. මෙය සනිටුහන් කළේ අන් කිසිවක් නොව නිර්ධන පංතියට දැනටමත් ධනේශ්වර පංතියට එරෙහිව ඉතිහාසයේ කරලියට අවතීර්ණය වී ඇති බවයි. 1830 ගණන්වලදී ලෝකයේ සංවර්ධිතම කාර්මික රට වූ එංගලන්තයේ හි ඉතිහාසයේ මුල්ම වූවන්ගේ කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය යහපත් කළ හැක්කේ දේශපාලන අරගලයක් තුළින් පමණක් බවයි.

ධනවාදයේ සංවර්ධනය පංති ප්‍රතිවිරෝධතා උත්සන්න කළේය. එසේම පොදු ජනතාවගේ දුගීභාවය සහ නිර්ධන පංතියේ පීඩනය ආදී සාධක මගින් එකල සමාජ මතවාදය සකස් විය. මානව සංහතියේ බුද්ධිමය වශයෙන් සක්‍රීය කොට මේ තත්ත්වයෙන් අත්මිදීමේ විවිධ මාර්ග, විකල්ප සොයන්නට විය. මෙය මනෝරාජික සමාජවාදී මතවාදය තුළ පිළිබිඹු විය. මනෝරාජික සමාජවාදයේ අදහස් යුරෝපයේ විවිධ රටවල එකම කාලයක් තුළ දී වර්ධනය වීම විශේෂත්වයකි. සෙන් සීමන් ප්‍රංශයේ ද, රොබට් සීවන් එංගලන්තයේ ද, මේ අදහස් ව්‍යාප්ත කිරීමට සමත් වූහ. 18 වන සියවස අගභාගයේ සහ 19 වන සියවස මුලදී මේ මනෝරාජික සමාජවාදී චින්තනය තුළ පිළිබිඹු වූයේ අන් කිසිවක් නොව වඩාත් හොඳ වඩාත් සාධාරණ සමාජ ක්‍රමයක් සඳහා වූ පොදු ජන අභිලාෂයයි.



යුරෝපා මහද්වීපයේ ජනමාධ්‍යවේදය ඇති වීම සඳහා බලපෑ හේතු අතර විශේෂයෙන්ම වැදගත් වන හේතු සාධක කීපයකි. ආර්ථික වර්ධනය, යුරෝපයේ විශාල රටවල ධනේශ්වරය තහවුරු වීම, විප්ලවීය හා, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ආරම්භය වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඉහත දක්වන ලද හේතු සාධක යුරෝපීය රටවල වාරප්‍රකාශනවල සම්භවයට සහ වර්ධනයට ඉවහල් වූ බව පෙනේ. එම වාරප්‍රකාශන දේශපාලන බලය සඳහා සටන් කරන විවිධ පංතිවල සහ කණ්ඩායම්වල සහ වුවමනාවන් නියෝජනය කළේය.

ජනමාධ්‍ය වශයෙන් පුවත්පත් හා සඟරා, දාර්ශනික, සමාජීය, දේශපාලනික අදහස් ව්‍යාප්ත කිරීමේ හා තහවුරු කිරීමේ ප්‍රධානතම මාධ්‍යයක් බවට පත් විය. මනෝරාජික සමාජවාදීහු සිය අදහස් පොදු ජනතාව තුළ චාර්ටස්වාදී ව්‍යාපාරයේ වර්ධනය එහි චාර්ටස්වාදී ජනමාධ්‍ය බිහිවීමට තුඩු දුන්නේය. එසේම 18 වන සියවස අවසානයේ දී ප්‍රංශය ධනේශ්වර විප්ලවය සමයේ සිට පංතිය හා දේශපාලන අරගලය තුළ ජනමාධ්‍යවේදය ජනමත නිර්මාණය කිරීමේ කාර්යයෙහි ලා අතිවිශාල මෙහෙයක් ඉටු කළේය.

අනාදිමත් කාලයක සිටම ජර්මානු සමාජයේ පැවති ඓතිහාසික විශේෂත්වයක් හේතුකොට ගෙන එහි ප්‍රතිගාමීත්වයේ ආධිපත්‍ය බල පැවැත්විණ. එම නිසා සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර බල පැවැත්මට එය හිතකර පරිසරයක් නොවීය. "ජර්මනිය තුළ සැබෑ ප්‍රබල ප්‍රායෝගික දේශපාලන පක්ෂ අතර අරගලයක් නොමැති වූ නිසා එහි සමාජ ව්‍යාපාරය සාහිත්‍ය ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. මෙහිදී අවධාරණය කළ යුත්තේ දේශපාලනික සමාජීය ව්‍යාපාරය සාහිත්‍යයික ජනමාධ්‍යවේදී ස්වරූපයක් බවට පරිවර්තනය වූ බවය. මේ අනුව ජර්මනිය තුළ පැවති කොන්දේසි මත ලේඛකයින්ගේ, ජනමාධ්‍යවේදීන්ගේ සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදීය ක්‍රියාකාරීත්වයේ වැදගත්කම විවෘත සහ සැඟවුණු ස්වරූපයෙන් සමාජ සංවර්ධනය සඳහා වූ ජනමතය ප්‍රකාශයට පත් විය. විශේෂයෙන්ම මෙහිදී ජර්මානු ධනේශ්වරයේ මතය පිළිබිඹු වූ බව මාක්ස් සහ එංගල්ස් සිය "ජර්මානු මතවාදය" නමැති සුප්‍රකට කෘතියෙහි සඳහන් කළහ.

[2] F mering Karl marx, History of his life, Moscow, 1957, P, 262

ජර්මනිය හා යුරෝපයේ ආදී බොහෝ රටවල කම්කරු ව්‍යාපාරය ආරම්භයේදී කම්කරුවන්ගේ, කම්කරු නායකයින්ගේ අදහස් මත ප්‍රකාශ කිරීම සඳහාත් ඔවුන්ගේ වුවමනාවන් ආරක්ෂා කිරීම සඳහාත් මුලින්ම ඉවෙන් මෙන්ද ඉන් අනතුරුව සවිඥානිකව ද වාර ප්‍රකාශන කෙරෙහි අවධානය යොමු කළේය. බොහෝ විට යුරෝපයේ විශේෂයෙන් ජර්මනියේ කම්කරු සංවිධාන සහ සංගම් නිර්මාණය වීම ජනමාධ්‍ය ප්‍රකාශන බිහිවීමට සමගාමීව සිදු වූ බව පෙනේ. නමුත් ඒ සෑම අවස්ථාවකදීම එය සාර්ථක වූයේ නැත. ඊට හේතුව රට තුළ පැවති දේශපාලන ප්‍රතිගාමීත්වයට පමණක් නොව නිර්ධන පංති ජනමාධ්‍යවේදයේ අරමුණු හා කර්තව්‍යයන් පිළිබඳව තිබූ අනවබෝධයට ද මේ සඳහා සැලකිය යුතු බලපෑමක් කළේය.

සමාජ සංවර්ධනය, විප්ලවීය ව්‍යාපාරයේ නැගීම, ධනේශ්වර සබඳතාවන්ගේ වර්ධනය හේතු කොටගෙන කම්කරු පංතියට මග පෙන්විය හැකි අලුත් සමාජ න්‍යාය අවශ්‍යතාව මතු කළේය. එම න්‍යාය මුල සිටම ධනේශ්වරයට ප්‍රතිවිරුද්ධ වූද නිර්ධන පංති විමුක්තිය අරමුණු කරගන්නා වූද න්‍යායක් ලෙස හැඩගැසෙන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ මාක්ස්ගේ සහ එංගල්ස්ගේ න්‍යායික සහ ව්‍යවහාරික මැදිහත් වීම තුළ එම නව සමාජ න්‍යාය වන මාක්ස්වාදය නිර්මාණය වූ අතර එය නිර්ධන පංතියේ ලෝක දෘෂ්ටිවාදය බවට පත් විය.

මේ බිහිවන්නාවූ නිර්ධන පාංතික ජනමාධ්‍යවේදයේ න්‍යායික ප්‍රවාදයන් නිර්මාණය කිරීම වඩාත් වැදගත් මෙන්ම සංකීර්ණ කටයුත්තක් ද වූ බව පැහැදිලි වේ.

ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය අනාවරණය කර ගනිමින් ඓතිහාසික භෞතිකවාදි න්‍යාය නිර්මාණය වීමෙන් පසු ජනමාධ්‍යවේදය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය බිහිවූ බව ප්‍රකාශ කළ හැකිය.



කාල් මාක්ස් හා ප්‍රෙඩ්රික් එංගල්ස් විසින් මානව සමාජය සංවර්ධනයේ නියමානුකූලතා සොයා ගැනීම නිශ්චිත ලෙසම මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය යනු අන් කිසිවක් නොව ජනමාධ්‍යවේද ක්ෂේත්‍රය තුළ ඓතිහාසික භෞතිකවාදයේ මූලධර්මවල නිශ්චිතකරණයකි. "මාක්ස්වාදයට පෙර සමාජ ජීවිතය අවබෝධ කරගැනීම සඳහා භෞතිකවාදී මූලධර්ම භාවිත නොකරන ලදි"[3]. මාක්ස් හා එංගල්ස් ප්‍රථම වරට භෞතිකවාදී පදනමක් සහිත ව ජනමාධ්‍යවේදයේ න්‍යාය හා ව්‍යවහාර වටහා ගැනීම දක්වා ප්‍රවේශ වූහ. ද්වන්ධාත්මක හා ඓතිහාසික භෞතිකවාදයේ මූලධර්ම භාවිත කරමින් මාක්ස් හා එංගල්ස් ජනමාධ්‍යවේද ක්ෂේත්‍රයට අයත් ප්‍රපංචයන්ගේ හරය අනාවරණය කිරීමටත්, ඒවායේ පැවැත්මේ වර්ධනයේ නියමානුකූලතාව අනාවරණය කිරීමටත් ජනමාධවේදය සමාජ ජීවිතයෙහි දරන ස්ථානය හා එහි කාර්යභාරය පෙන්වා දීමටත් සමත් වූහ.

ඇත්ත වශයෙන්ම ඓතිහාසික භෞතිකවාදය යනු ද්වන්ධාත්මක භෞතිකවාදයේ ක්‍රමවේදාත්මක මූලධර්ම සමාජ ජීවිතය ක්ෂේත්‍රයට අදාළව නිශ්චිතකරණය කිරීමෙනි. එසේම මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය යනු ඓතිහාසික භෞතිකවාදී මූලධර්ම ජනමාධ්‍යවේද ක්ෂේත්‍රයට අදාලව නිශ්චිතකරණය කිරීමකි. ඓතිහාසික භෞතිකවාදය යනු සමාජ ජීවිතය පැහැදිලි කිරීම පිළිබඳ පොදු දාර්ශනික පදනමක් වන අතරම එය මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ දාර්ශනික පදනම වන්නේය.

සමාජ විඥානයට සාපේක්ෂව සමාජ සත්තාවේ ප්‍රාථමික බවත්, ආර්ථික පදනම සහ සමාජ උපරි ව්‍යුහය අතර පවතින්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධයත් මාක්ස් විසින් 1859 දී දේශපාලන "ආර්ථික විද්‍යාවට විවේචනයක්" නැමති කෘතියේ පෙරවදනෙහි සම්භාව්‍ය ස්වරූපයෙන් සූත්‍රගත කළේය. ජනමාධ්‍යවේදයේ කාර්යභාරය භූමිකාව හා වැදගත්කම සමාජයේ උපරිව්‍යුහයේ සංරචකයන් වශයෙන් අවබෝධ කර ගැනීම සඳහා මඟ පෑදුවේය.

[3] වී.අයි. ලෙනින්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 18, පිටුව 350-351

සමාජය එහි සංරචකයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවන්ගේ සහ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයේ මෙන්ම, සමාජ වෙනස් වීම හා වර්ධනය වීම එහි අභ්‍යන්තර ප්‍රභවයන්ගේ ක්‍රියාකාරීත්වය ජනමාධ්‍යවේදයේ පැවැත්මේ හා වර්ධනයේ අභ්‍යන්තර ප්‍රභවයන් ඓතිහාසික භෞතිකවාදය මඟින් පැහැදිලි කරනු ලැබේ. "වංකගිරිකයක් සහ ව්‍යාකූලත්වයක් සේ පෙනී ගිය සමාජ ජීවිතයේ නියමානුකූලතා වටහා ගැනීම සඳහා පංති අරගල න්‍යාය ඉවහල් වූ බව"[4] ලෙනින් පෙන්වා දුන්නේය. මාක්ස්වාදය විසින් කියවීම පිළිබඳව ඉදිරිපත් කරන ලද මෙම න්‍යායික මග පෙන්වීම තුළින් ජනමාධ්‍යවේදයේ වර්ධනයේ විශේෂතා විශ්ලේෂණය කිරීම සඳහා ද අදාළ කර ගත හැකිය. මාක්ස්වාදය පංති අරගල න්‍යාය සමාජයේ දෘෂ්ටිවාදීමය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය හා හරය තේරුම් ගැනීම සඳහා යොදමින් එය සමාජය ජීවිතයට සිදු කරනු ලබන බලපෑම විද්‍යානුකූලව පැහැදිලි කරන ලදි.

මේ අනුව ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය හා ඓතිහාසික භෞතිකවාදය නිර්මාණය කිරීම මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය බිහිවීම සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වූ බවට අවධාරණය කළ යුතුය.

මාක්ස්වාදී ජනමාධ්‍යවේදී න්‍යාය හැඩගැස්වීමෙහිලා තවත් ඉතා වැදගත් පූර්ව කොන්දේසියක් වූයේ මාක්ස්ගේ හා එංගල්ස්ගේ සමාජ දේශපාලන ක්‍රියාකාරීත්වය සහ විප්ලවීය ව්‍යවහාරයයි.

මාක්ස්වාදයට පෙර වූ සමාජය පිළිබඳ විවිධ න්‍යායික - සංකල්පීය හැදෑරීම්වල මූලික ලක්ෂණයක් වූයේ න්‍යාය හා ව්‍යවහාරය අතර වූ නොගැළපීමයි. නමුත් මාක්ස්වාදී සංකල්පය තුළ න්‍යාය හා ව්‍යවහාරය අතර ඒකීයත්වයක් ප්‍රදර්ශනය විය. සමාජය විප්ලවීය ආකාරට වෙනස් කිරීමේ න්‍යායික භාවිතයක් ලෙස මාක්ස්වාදය වේගයෙන් ව්‍යාප්ත වන්නට විය.

[4] වී.අයි.ලෙනින්, සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 26. පිටුව 58



සියලු න්‍යායික හා දාර්ශනික ගොඩනැගීම්වල සත්‍යවාදීභාවයේ ඒකායන නිර්ණායකය හා පදනම ව්‍යවහාරය බව අවධාරණය කරමින් මාක්ස්වාදය සමාජ විද්‍යා ක්ෂේත්‍රයට නව ප්‍රවේශයක් දුන්නේය. සමාජ විද්‍යාවන්ට විද්‍යාත්මක වූද වාස්තවික වූද පදනමක් සකස් කිරීමෙහිලා ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී සංකල්පය අතිශයින්ම මූලාධාර විය. එහි අර්ථය නම් ස්වභාවික විද්‍යාවන් සේම සමාජීය විද්‍යාවන්ට ද ඊටම ආවේණික වූ විෂයමූලික නියමයන් පවතින බවත් එම නියමයන් විඥානයෙන්, චින්තනයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන බවත් මිනිසා සිය අධ්‍යයනයක් තුළින් එම නියමයන් අනාවරණය කොට ගෙන සමාජ ප්‍රගතිය සඳහා එම නියමයන් භාවිත කිරීමේ ශක්‍යතාව මිනිසා සතු අද්විතීය ගුණයක් බවත් ය.

මාක්ස්වාදයේ පුරෝගාමීහු සමාජ ජීවිතයේ භාවිතයන් සමඟ ඉතාම සමීපව කටයුතු කළ බැවින් ඔවුහු පරම පවිත්‍ර න්‍යායාචාර්යහු නොවූහ. ඔවුහු න්‍යාය තුළ සමාජ භාවිතය සූත්‍රගත නොකළ අතර සමාජ භාවිතය තුළ න්‍යාය සූත්‍රගත කළහ. මෙම ස්ථාවරය ඔවුන්ට සමාජය පැවැත්මේ, ක්‍රියාත්මක වීමේ, නියාමනයන් අනාවරණය කර ගැනීමට අවශ්‍ය පසුබිම් සකස් කළේය.

සමාජ අරගල තුළ මාක්ස් න්‍යායේ හා ව්‍යවහාරයේ ඒකීයත්වය නිර්මාණය කළේය. පවතින්නා වූ සැබෑ කොන්දේසි වෙනස් කිරීම සඳහා ක්‍රියාකාරී, ප්‍රායෝගික හා විප්ලවීය න්‍යාය හා ව්‍යවහාරය විප්ලවීය අරගලයක් මාක්ස්ට අවශ්‍ය විය. භාවිතය තුළ ඒකාත්මික කිරීමේ අභිලාෂයන් මාක්ස් හා ඔවුන්ගේ සගයන් විසින් ආරම්භ කරන ලද සඟරාවල මූලික ප්‍රතිපත්තිය පවා සකස් කළේය. මෙයටත් වඩා ඉදිරියට යමින් මාක්ස් සමස්ත ජර්මානු විප්ලවය ප්‍රජාතාන්ත්‍රික මාධ්‍යයේ මුළු ක්‍රියාකාරී වැඩ පිළිවෙල ද නිර්ණය කළේය. මේ කාලය තුළ සිය ප්‍රායෝගික විප්ලවය හා දේශපාලන ක්‍රියාකාරීත්වය මාක්ස් පිළිබිඹු කළේ ජනමාධ්‍ය සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථවේදී ක්‍රියාකාරී ස්වරූපය මගිනි.

එම නිසා ජර්මානු සමාජය නවීකරණය කිරීම හා ප්‍රතිසංස්කරණ කිරීම සඳහා ගෙන ගිය දේශපාලන අරගලය තුළ විප්ලවී ප්‍රජාතාන්ත්‍රිය හා කම්කරු ජනමාධ්‍ය අවියක් කරගැනීමට මාක්ස් ප්‍රයත්න දැරීය.

1845 දී පළ කරන ලද "ෆියෙර්බාහ් ගැන තීසිය" මහා ලෝක දෘෂ්ටියක උපත සනිටුහන් කළ ප්‍රථම ලියවිල්ල"[5] වූ බව එංගල්ස් ප්‍රකාශ කළේය." "දාර්ශනිකයෝ විවිධාකාර ලෙස ලෝකය අර්ථකථනය කළහ. නමුත් කළ යුත්තේ එය වෙනස් කිරීමයි"[6] යන ප්‍රකාශනය සමාජ ජීවිතය තුළ විප්ලවීය භාවිතයේ තීරණාත්මක භූමිකාව පිළිබිඹු කළේය.

මෙය මාක්ස් විසින් ඉදිරිපත් කළ නව ලෝකදෘෂ්ටිවාදයේ මූලික මූලධර්මය වන්නේ ය. එම මූලධර්මය සමගම නව ජනමාධ්‍යවේද භාවිතයක දාර්ශනික දැක්ම සනිටුහන් කළ බව ප්‍රකාශ කළ යුතුය. මේ අනුව මෙය මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ දෘෂ්ටිමය පදනම් නිර්මාණය කළේය.

සමාජ වර්ධනයත් සමගම මාක්ස්වාදය ද වර්ධනය විය. මාක්ස්වාදය නිරන්තරවම සමාජීය සංවර්ධනයේ අත්දැකීම් පදනම් කොට ගෙන සිය සංකල්පීය ව්‍යුහය හැඩගස්වා ගත්තේ ය. මෙය මාක්ස්වාදීය ජනමාධ්‍යවේදී න්‍යායේ වර්ධනයට ද එක සේම අදාළ වන්නේය.

විවිධ පක්ෂවල, පංතිවල සමාජ බලවේගවල අරගලයක් සමගම මාක්ස්වාදීය ජනමාධ්‍යවේදී න්‍යාය ක්‍රමානුකූලව හා ඓතිහාසිකව වර්ධනය විය.

---

[5] කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස් සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 21, පිටුව 371

[6] කාල් මාක්ස්. ෆ්‍රෙඩ්රික් එංගල්ස් සම්පූර්ණ කෘති එකතුව, වෙළුම 3, පිටුව 4



ජනමාධ්‍යවේදය සමාජ දේශපාලන ක්‍රියාකාරීත්වයේ සංයුක්ත ස්වරූපයක් වශයෙන් ක්‍රියාකාරන අතර එය ව්‍යවහාරික විප්ලවීය ක්‍රියාකාරීත්වයෙන් වෙන් කළ නොහැකිය. මාක්ස් හා එංගල්ස් ප්‍රායෝගිකව ජනතාව සමග සමාජ විප්ලවීය ක්‍රියාවලිය තුළ ක්‍රියාකරමින් ජනමාධ්‍යවේදය පිළිබඳව සිය අදහස් වර්ධනය කරගත් බව අවධාරණය කළ යුතුය. මාක්ස් හා එංගල්ස්ගේ විද්‍යාත්මක - න්‍යායික කටයුතුවලට ඓන්ද්‍රිය ඉදිරි වර්ධනයක් ලෙස ජනමාධ්‍යවේදීය ක්‍රියාකාරීත්වය ඔවුහු දුටහ. අපි විද්‍යාඥයින්ගේ අලුත් විද්‍යාත්මක අදහස් ලොකු පොත්වල ලිවීමට පමණක් සීමා වීම කිසිසේත්ම බලාපොරොත්තු නොවන බව එංගල්ස් ප්‍රකාශ කරමින් මාක්ස්වාදයට විප්ලවීය භාවිතය සමග ඇති සබඳතාව අවධාරණය කළේය. "අප දෙදෙනා දැනටමත් ඉතා ගැඹුරු අන්දමට දේශපාලන ව්‍යාපාරයට අවතීර්ණව කටයුතු කරන්නේය. එසේම බටහිර ජර්මානු බුද්ධිමතුන් කිහිපදෙනෙක් ද අපේ අනුගාමිකයන් වශයෙන් අපට සම්බන්ධ වී කටයුතු කරන අතර විශේෂයෙන් සංවිධානාත්මක කම්කරුවන් සමග ප්‍රමාණවත් සබඳතා අපට තිබේ"[7]. මාක්ස් හා එංගල්ස් ඔවුන්ගේ අදහස් කම්කරු පංතිය තුළට ගෙන ගොස් කම්කරුවන් තුළ විශ්වසනීයත්වය ගොඩනැගිය හැකි වඩාත්ම වැදගත් මාධ්‍ය ලෙස සලකන ලද්දේ ජනමාධ්‍යවේදයයි (වාර ප්‍රකාශනවේදයයි). විශේෂයෙන්ම මාක්ස් හා එංගල්ස් "Deutsche Brusseler Zeitung" මගින් එංගල්ස් චාර්ටස් ව්‍යාපාරයේ මාධ්‍ය සමග මෙන්ම ප්‍රංශ සමූහාණ්ඩුවාදී පුවත්පත් හා සඟරා සමග සිය නිර්මාණාත්මක දායකත්වය දෙමින් සම්බන්ධතා පවත්වාගෙන ගියහ. "විද්‍යාත්මක සමාජවාදී අදහස් ව්‍යාප්ත කිරීම සඳහා පුවත්පත් අතිශයින්ම වැදගත් වන අතර ඒ සඳහා අප රැඩිකල් හා කම්කරු පංති සංවිධාන සමග මෙන්ම මාධ්‍ය ආයතන සමග පවත්වාගෙන ගිය සබඳතාව ඊට වඩා හොඳ විය හැකිය"[8].

---

[7] කාල් මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස් එකතු කළ සම්පූර්ණ කෘති. වෙළුම 21, පිටුව 221

වී. අයි. ලෙනින් සිය පර්යේෂණාත්මක කටයුතුවල දී රුසියාවේ සමාජ - ආර්ථික හා දේශපාලන ගැටලු පිළිබඳව පමණක් නොව රුසියානු කම්කරු පංති ජනමාධ්‍යවේදය පිළිබඳව සිය ගැඹුරු අවධානය යොමු කළේය. රුසියාවේ "කම්කරු පංතිය ජනමාධ්‍යවේදය, ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ව්‍යාපාර සමග වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධ බව"[1] ලෙනින් පෙන්වා දුන්නේය. රුසියානු ජනමාධ්‍යවේදය පිළිබඳව ලෙනින්ගේ ස්ථාවරය රුසියාවට පමණක් සීමා නොවන අතර එය වෙනත් රටවලට ද අදාළ වේ. ඕනෑම රටක කම්කරු පංති ජනමාධ්‍යවේදය වර්ධනයත් එහි න්‍යායික සංකල්පීය ව්‍යුහය හැඩගැසීමත් ප්‍රජාතන්ත්‍රවාදී හා කම්කරු පංති ව්‍යාපාරය සමග අවියෝජනීය ලෙස සම්බන්ධය. විශේෂයෙන්ම මාක්ස්වාදී ජනමාධ්‍යවේදයේ න්‍යායික සංකල්පීය ව්‍යුහය ලෝක කම්කරු පංති සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයෙන් තොරව බිහිවීම නොහැකි තරමට එය සමාජ ව්‍යාපාර සමග සම්බන්ධය. මාක්ස්වාදීය ජනමාධ්‍යවේදී න්‍යායික සංකල්ප ව්‍යුහය විප්ලවීය භාවිතයේ විශේෂතා හා ගති ලක්ෂණ සමග මෙන්ම මාක්ස්වාදී පුරෝගාමීන්ගේ දැවැන්ත න්‍යායික ව්‍යවහාරික පරිශ්‍රමයන් සමග සම්බන්ධ බව සැලකිය යුතුය.

ඓතිහාසික ක්‍රියාවලිය තුළ බොහෝ වාස්තවික නියමයන් මතු වන්නේ පුද්ගල ස්වරූප අදාළ විෂයමූලික ක්‍රියාවලින් පුද්ගලයන්, කණ්ඩායම් හා සමාජ ව්‍යාපාර මගින් සාක්ෂාත්කරණය වන්නේය. මාක්ස්වාදී ජනමාධ්‍යවේද සංකල්පයේ ඓතිහාසික හා එහි න්‍යායාත්මක හැඩගැස්ම කෙරෙහි කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ පෞරුෂිය සහ පුද්ගලික අත්දැකීම් අතිශය වැදගත් වී ඇති බව පැහැදිලි වන්නේය.

විශේෂයෙන්ම ඔවුන් පුද්ගලික ජනමාධ්‍යවේදනාත්මක සහ සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදී ප්‍රකාශනවේදීය අත්දැකීම් මෙහි දී විශාල වැදගත්කමක් දරන්නේ ය.

---

[1] කාල් මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස් එකතු කළ සම්පූර්ණ කෘති. වෙළුම 21, පිටුව 221

[1] වී.අයි.ලෙනින් එකතු කළ සම්පූර්ණ කෘති වෙළුම 25, පිටුව 93



ජනමාධ්‍යවේදී ක්‍රියාකාරීත්වය හුදු ජනමාධ්‍යවේදී ක්‍රියාකාරීත්වය පරාසයක් තුළ පමණක් ඔවුහු ස්ථාන ගත නොකළහ. සෑම විටම ඔවුන් ඔවුන්ගේ ජනමාධ්‍යවේදාත්මක සහ සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදී ක්‍රියාවලිය විප්ලවීය - ව්‍යවහාරික පක්ෂමය හා දේශපාලන ක්‍රියාකාරකම්වල සැලකිය යුතු කොටසක් වශයෙන් සැලකිල්ලට ගත්තේය. මාක්ස් හා එංගල්ස් එම කටයුතු ඔවුන්ගේ විද්‍යාත්මක න්‍යායික දැනුමින් වෙන් නොකළ අතර න්‍යාය හා ව්‍යවහාරය සංයුක්ත කරන සංකීර්ණයක් ලෙස දුටුවේය. සමහර විට වඩාත් වැදගත් න්‍යායික අදහස් මුලින්ම ජනමාධ්‍යවේදාත්මක නිර්මාණ තුළ ප්‍රකාශිතව ඉන් පසු ඔවුන්ගේ මූලික න්‍යායාත්මක කෘතිවලට ඇතුළත් කරන ලදී. මෙය න්‍යාය හා භාවිතය ජනමාධ්‍යවේදාත්මක සංදර්භය තුළ ක්‍රියාත්මක වීමේ සංකීර්ණ ස්වරූපය කියා පාන්නකි. ජනමාධ්‍යවේදියා යම්කිසි නිර්මාණයකට සූදානම් වීම තුළම ඊට වඩා ගැඹුරු න්‍යායික සූත්‍රගත කිරීමකට උත්තේජනයක් ද විය හැකිය. මාක්ස් සංකීර්ණ ආර්ථික ප්‍රශ්න කෙරෙහි සිය අවධානය යොමු කිරීමට තුඩු දී ඇත්තේ ද ජර්මනියේ රයින්ස්කි ප්‍රදේශයේ හොර වන කැපීම සහ නිදහස් වෙළඳාම පිළිබඳව රයින්ස්කි පුවත්පත (Rheinesche Zeitung) සමග සිදු වූ සංවාදයක ප්‍රතිඵලයක් ලෙසිනි. මෙයට වෙනස් අවස්ථාවකදී න්‍යායාත්මක අදහස් ජනමාධ්‍යවේදාත්මක ස්වරූපයට සරිලන ආකාරයට ඉදිරිපත් කිරීමට ද මාක්ස්ගේ හා එංගල්ස්ගේ ක්‍රියාකාරකම් තුළ නිරීක්ෂණය කළ හැකිය. නිදර්ශනයක් වශයෙන් මාක්ස් හා එංගල්ස්ගේ ඇමරිකා එක්සත් ජනපදයේ (New - York Daily Tribune) පුවත්පතට යවන ලිපි මේ වර්ගයට අයත් වේ. එම ලිපි මූලික වශයෙන් සමකාලීන දේශපාලනික, ආර්ථික ප්‍රශ්න පිළිබඳ සම්පාදනය වූ ඒවා විය. මාක්ස් හා එංගල්ස් සිය ජනමාධ්‍යවේදාත්මක හා සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථවේදී ක්‍රියාකාරකම් සලකන ලද්දේ ඔවුන්ගේ න්‍යායික, විප්ලවීය ව්‍යවහාරික, පාක්ෂික ක්‍රියාකාරීත්වයේ අත්‍යවශ්‍ය ඓන්ද්‍රිය ස්වරූපයක් වශයෙනි. විශේෂයෙන්ම "කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය" සම්පාදනය

කිරීමේ දී මාක්ස් හා එංගල්ස් සමස්ත නූතන ඉතිහාසයේ පොදු ලක්ෂණ සැලකිල්ලට ගත්තේ ඉහත තාර්කික සංකල්පීය ක්‍රමවේදයට අනුවය.

ජනමාධ්‍යවේදිය හා සමාජ දේශපාලන ප්‍රකාශනෝර්ථවේදිය සඳහා මාක්ස්වාදයේ ඇති වැදගත්කම අවධාරණය කරමින් "නව රීන්ස්කි" පුවත්පත (Neue Rheinische Zeitung) කාලීන දේශපාලන සිද්ධි පිළිබඳ ලිපි පෙළක්ම මාක්ස් හා එංගල්ස් සැපයීය. සමාජීය හා දේශපාලනික ගැටලු පිළිබඳව සමාජවාදී අදහස් ජනතාව අතරට ගෙන යාම සඳහා මාක්ස් නව රීන්ස්කී පුවත්පත ප්‍රයෝජනයට ගත්තේ ය. මෙම පුවත්පත පාක්ෂික පුවත්පතක් විය.

මාක්ස්ගේ මුළු ජීවිත කාලයම බොහෝ පුවත්පත් සඟරා හා වාර ප්‍රකාශන සමඟ සම්බන්ධව සිටි අතර එංගල්ස් ඊටත් වඩාත් ජනමාධ්‍ය සමඟ සම්බන්ධව කටයුතු කළේය. ජනමාධ්‍යවේදය හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ මාක්ස්ට අති විශාල අත්දැකීම් සමුදායක් තිබුණේය. ඔහු පුවත්පත් සඟරා හා වාරප්‍රකාශන සංස්කාරකවරයෙකු වශයෙන් ද පුවත්පත් හා සඟරා සංවිධායකයෙකු වශයෙන් ද ග්‍රාහකත්වය සමඟ සබඳතා ගොඩනගා ගන්නකු වශයෙන් ද සමස්ත ජනමාධ්‍ය කර්මාන්තය පිළිබඳ අතිවිශාල අත්දැකීම් සම්භාරයකින් පරිපූර්ණව සිටියේය.

කාල්මාක්ස්ට වයස අවුරුදු 24 කදී, එනම් 1842 දී ඔහු ජනමාධ්‍යවේදියෙකු හා ජනමාධ්‍යකරුවෙකු වශයෙන් කටයුතු කරන්නට ක්‍රියාකාරී ලෙස සහභාගී විය. 1841 මාක්ස් විසින් "Athenaum" සඟරාවේ පල කරන ලද මාක්ස්ගේ ප්‍රථම කවි පංතිය ඔහු ජනමාධ්‍යවේද කටයුතු සමඟ සම්බන්ධ කිරීම යෝග්‍ය නොවේ.
1842 දී මාක්ස් විප්ලවීය ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පතක් වූ රීන්ස්කි පුවත්පතේ (Rheinische Zevtung) කොටස්කරුවෙකු මෙන් පසුව එහි සංස්කාරක වශයෙන්ද, ඉන් අනතුරුව රූගේ සමඟ 1844 දී "Deutsch -



Franzosische Jahrbucher" සඟරාවද, 1848 - 1849 කාලය තුළ සුප්‍රකට Neue Rheinische Zeitung පුවත්පතේ සම සංස්කාරක වශයෙන් ද, 1849 - 1850 කාලය තුළදී Neue Rheinische Zeitung ඉදිරි වර්ධනයක් වූ Neue Rheinische Zeitung - Politisch - Okononi Sene Revun" සඟරාවේ සංස්කාරක වශයෙන් ද 1844 පැරිස් හිදී පළමු Vorwarts කුඩා පුවත්පතක්ද, 1847 - 1848 කාලයේ දී බ්‍රසල්ස්හි දී පළ වූ "Deutsche - Bruisseler - Zeitung" 1859 ලන්ඩන්හි පළ වූ "Das Volk" හා වෙනත් වාර ප්‍රකාශනයක් හිදී ද නායකයා හා මග පෙන්වන්නා ලෙස මාක්ස් කටයුතු කළේය.

විශාල ඇමරිකානු ප්‍රගතිශීලී පුවත්පතක් වූ New - York Daily Tribune හි යුරෝපීය වාර්තාකරු ලෙස දශකයක් (1851 - 1862) පුරා කටයුතු කළේය.

මාක්ස්ගේ සහ එංගල්ස්ගේ ජනමාධ්‍යවේදාත්මක ක්‍රියාකාරීත්වය මූළමනින්ම සමාජ දේශපාලන සන්දර්භයකින් සමන්විත විය. මාක්ස් හා එංගල්ස්ගේ ජනමාධ්‍යවේදාත්මක භාවිතය තුළ Journalist හා Publisit යන සංකල්ප දෙක සම්පාත වූ බව පෙනේ. මාක්ස් පුවත්පත් හා සඟරා සංවිධානය කරමින් ඒවායේ ප්‍රධාන කර්තෘ ලෙස ඉදිරිපත් විය. Neue Rhenisehe Zeitung හි මාක්ස්ගේ ලිපි 250 ට වඩා පළ විය. බොහෝ විට දිනපතා ලිපියක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පුවත්පතේ පළ වූ බව පෙනේ.

මාක්ස්ගේ ජනමාධ්‍යවේද භාවිතය ආරම්භයේ සිටම ජාත්‍යන්තරවාදී ස්වභාවයක් ගත්තේය. මාක්ස්ගේ සමාජ - දේශපාලනික හා ජනමාධ්‍යවේදාත්මක නිර්මාණ බොහෝ යුරෝපීය රටවල කම්කරු හා ප්‍රජාතන්ත්‍රවාදී ජනමාධ්‍යයන්හි නිරතුරුවම පළ විය. ජර්මනියේ, ඔස්ට්‍රියාවේ, බෙල්ජියමේ, ඇමරිකා එක්සත් ජනපදයේ හා වෙනත් රටවල කම්කරු ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පත් හා සඟරා තුළ මාක්ස්ගේ ලිපි නිරන්තරව පළ විය.

ඒවාගේම චාස්ටි ව්‍යාපාරයේ ප්‍රකාශ වන "The People Paper" " Notes to the People" ද වෙනත් පළමු වැනි ජාත්‍යන්තර හා සම්බන්ධ "The Workman is Advocate" " The Commonwealth" ඒ අතර ප්‍රධාන විය. ප්‍රතිගාමීත්වය හා මර්දනය දියත් වූ කාලවලදී මාක්ස් ඉතා උපක්‍රමශීලීව හා නිර්මාණාත්මකව ප්‍රජාතන්ත්‍රවාදී රැඩිකල්වාදී ලිබරල් ධනේශ්වර පුවත්පත් හා සඟරා සිය අදහස් ප්‍රචාරණය සඳහා යොදා ගත්තේ ය.

එංගල්ස් 1839 ජනමාධ්‍යවේදාත්මක හා සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදීය මාක්වාදී ජනාමාධ්‍යවේදී න්‍යාය හැඩගැස්ම හා වර්ධනය කෙරෙහි අති විශාල බලපෑමක් කළේය. එංගල්ස් ජනමාධ්‍යවේදියෙක්, සංස්කාරවරයෙක්, සංවිධායකයෙක් ලෙස මාක්ස් සමඟ සත්සන්දනාත්මකව සලකා බලන විට එංගල්ස් සතු අත්දැකීම් මාක්ස්ට වඩා තරමක් අඩුය. එංගල්ස් නායකත්වය දුන් වාරප්‍රකාශන ප්‍රමාණය එතරම් විශාල නොවූ අතර බොහෝ විට මාක්ස් හෝ වෙනත් සමකාලීනයෙකු සමග ඒවාට නායකත්වය දෙන ලදී.

නිදර්ශනයක් වශයෙන් M හෙස් සමඟ 1845 දී සමාජ කැඩපත (Gesellschaftesspiegel) සඟරාව ද 1848 - 1849 කාලයේදී මාක්ස් සමඟ Deutsche - Brusseler - Zeitung" පුවත්පතේ සම සංස්කාරකවරයෙකු වශයෙන් ද එංගල්ස් කටයුතු කළේය. 1849 - 1850 කාලයේදී මාක්ස් සමග එංගල්ස් Neu Rheinische Zeitung Polisch-Okonomische Revue" සඟරාව පළ කළේය. සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථවේදය පිළිබඳ කතා කරන විට එංගල්ස් මාක්ස්ට දෙවැනි වූයේ නැත. එංගල්ස්ගේ සමාජ - දේශපාලනික ප්‍රකාශනාර්ථවේදය අති ප්‍රබල වූ අතරම ඔහු මුළු ජීවිත කාලයම කම්කරු හා සමාජවාදී ජනමාධ්‍යවේදය සමඟ නිරන්තරව කටයුතු කළේය. එංගල්ස් විවිධ රටවල මෙන්ම පොදුවේ කම්කරු හා සමාජවාදී ව්‍යාපාරයේ දැවෙන න්‍යායික සහ ප්‍රායෝගික ප්‍රශ්න පිළිබඳව නිරතුරුවම පුවත්පත් හා සඟරා මඟින් සිය අදහස් ප්‍රකාශ කළේය.



එංගල්ස් තුළ වූ ස්වභාවික විද්‍යා දැනුම ද මාක්ස් සමග එකට වැඩ කිරීමෙන් ලත් සමාජ - දේශපාලනික හා ජනමාධ්‍ය අත්දැකීම් ද පාදක කොටගෙන කරුණු හා සාධක දෙස නිශ්චිතව බලා ඉහළ පරිකල්පනයක් තුළ සමස්ත නිගමනයන්ට වෙත ප්‍රවිශ්ට වීමේ හැකියාව නිසා ප්‍රපංචවල හරය නිවැරදිව අනාවරණය කිරීමට ඔහුට හැකි විය. එංගල්ස්ගේ ප්‍රකාශවලවූ සුපැහැදිලි බව හා නිශ්චිත බව ඔහුගේ සමාජ - දේශපාලනික ප්‍රකාශනාර්ථවේදයේ ශෛලිය විශේෂත්වයක් වශයෙන් සැලකිය හැකිය. සංකීර්ණ න්‍යායික ප්‍රශ්න පොදු ජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා සුපැහැදිලි, සරල හා ආකර්ෂණීය ශෛලියක් එංගල්ස්ගේ නිර්මාණය තුළ දක්නට ලැබෙන්නේ අන් කිසිවක් නිසා නොව අදාළ නිර්මාණය තුළ අන්තර්ගත සහ ආකෘතිය ද, භාව සංවේදීතාව සහ සබුද්ධිකත්වය ද, මනා ලෙස සුසංවේදීව ඉදිරිපත් කිරීමට ඔහු සතු හැකියාව නිසා ය.

එංගල්ස් සතු වූ පුළුල් ජනමාධ්‍යවේදනාත්මක හා සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදනාත්මක අත්දැකීම් සම්භාරය සංකීර්ණ වූ ජනමාධ්‍යවේදනාත්මක භාවිතය හා න්‍යාය තුළ නිසි පරිදි දිශාගත වීම සඳහා ඔහුට ඉවහල් වූ බව ප්‍රකාශ කළ හැකිය. එය මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ පදනම සකස් වීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කොට තිබෙන බව පැහැදිලි වේ.

කාල්මාක්ස් හා ෆෙඩ්රික් එංගල්ස් නව පන්නයේ ජනමාධ්‍යවේදීන් සහ සමාජ දේශපාලනික ප්‍රකාශනාර්ථවේදීන් වූ බැවින් ඔවුන් සතු වූ ජනසන්නිවේදනාත්මක සහ සමාජ - දේශපාලනික ප්‍රකාශනාර්ථවේදාත්මක අත්දැකීම් මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ සංකල්පීය සකස් වීම කෙරහි ව්‍යුහය ප්‍රබල දායකත්වයක් සැපයූ බව පෙන්වා දිය යුතුය. මාක්ස් හා එංගල්ස් පූර්වව පැවති ධනේශ්වර ජනමාධ්‍යවේදයේ මූලධර්ම හා සම්ප්‍රදායන් දිගටම කරගෙන ගියේ නම් එහි න්‍යායික පදනම මූලමය වශයෙන් වෙනස් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ වැටහීම ඇති නොවන්නට තිබිණ.

මෙම ඓතිහාසික වූ ද සමාජීය වූව ද අවශ්‍යතාවය මාක්ස් හා එංගල්ස් සමාජ - දේශපාලන ක්‍රියාකාරීත්වය මගින් මතු වූ අතර එය කොමියුනිස්ට්වාදී ජනමාධ්‍යවේදයේ සංකල්පීය පදනමේ මූලික ප්‍රවණතාව හා ගති ලක්ෂණ නිර්මාණය වීමෙහි ලා තුඩු දුන්නේය. ඇත්ත වශයෙන්ම මාක්ස්වාදයේ පුරෝගාමීහු ජනමාධ්‍යවේද න්‍යායික හා ව්‍යවහාරික ක්ෂේත්‍රයේ සැබෑ විප්ලවීය පරිවර්තනයක් ඇති කළහ.

නිර්ධන පංතියේ පංති වුවමනාවන් සඳහා වූ අරගලයේ අවියක් බවටත්, නව ලෝක දෘෂ්ටිවාද ප්‍රචාරණය කිරීමේ මාධ්‍යයක් බවටත්, ශ්‍රමික හා පොදු ජනතාව අලෝකනය කිරීමේ හා ශික්ෂණය කිරීමේ මාධ්‍යයක් බවටත් ජනමාධ්‍යවේදය පත් විය. ධනවාදයට හා අත්තනෝමතික රාජාණ්ඩු පාලනයට එරෙහිව වැඩ කරන ජනතාව සංවිධානය කිරීමේ සහ සන්නද්ධ කිරීමේ අවියක් වශයෙන් ජනමාධ්‍යවේදය මාක්ස් හා එංගල් භාවිතයට ගනිමින්, ජනමාධ්‍යවේද ඉතිහාසයේ නිශ්චිත සන්ධිස්ථානයක් සනිටුහන් කළහ.

මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යායේ විශේෂ ලක්ෂණයක් වන්නේ එය ධනේශ්වර ජනමාධ්‍යවේදයේ න්‍යායික සහ ව්‍යවහාරික වටිනාකම් ප්‍රතික්ෂේප නොකර එහි සාධනීය හා ප්‍රගතිශීලී ලක්ෂණ නව ජනමාධ්‍යවේදය න්‍යාය ගොඩනැගීමේ දී නිර්මාණාත්මකව භාවිතයට ගැනීමයි. ලෝක ජනමාධ්‍යවේදයෙන් ඓතිහාසික උරුමයන් උකහා ගනිමින් නව පන්තියේ කොමියුනිස්ට් ජනමාධ්‍යවේදයක් නිර්මාණය කිරීමට මාක්ස්ට හා එංගල්ස්ට හැකි වූහ. මේ නව ජනමාධ්‍යවේදය පැරණි ජනමාධ්‍යවේදයෙන් බොහෝ හේතූන් නිසා වෙනස් වන්නේය. අරමුණ, ප්‍රවණතාව, ගතිලක්ෂණ, ව්‍යුහය, අන්තර්ගතය, ආකෘතිය, මාධ්‍ය ග්‍රාහක සම්බන්ධය ආදිය ඒ අතර ප්‍රධාන වේ. මෙම නව සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදය වැඩ කරන ජනතාවගේ දේශපාලන අවියක් ලෙස ද ඓතිහාසික ක්‍රියාවලියේ වුවමනාවන් නියෝජනය කිරීමේ ආයතනයක් ලෙස ද සමස්ත මනාව සංහතියේ අනාගතය වෙනුවෙන් සටන් කරන ක්‍රියාකාරී බලවේගයක් ලෙස ද ඉදිරිපත් විය.



මාක්ස්ගේ හා එංගල්ස්ගේ පුද්ගලික නිර්මාණාත්මක ක්‍රියාවලිය තුළ මෙම නව මාක්ස්වාදී ජනමාධ්‍යවේදය සහ සමාජ - දේශපාලනික ප්‍රකාශනාර්ථවේදය නිර්මාණය විය.

මාක්ස්ගේ හා එංගල්ස්ගේ ජනමාධ්‍යවේදාත්මක හා සමාජ - දේශපාලනික ප්‍රකාශනාර්ථවේදාත්මක ක්‍රියාකාරීත්වය තුළ ජනමාධ්‍යවේදයට විශේෂ වූද, නව්‍ය වූද, වෘත්තීයභාවයක් ආරෝපණය වූ අතර එය ප්‍රබල සමාජීය ආයතනයක් වශයෙන් ස්ථාපිත විය. ජනමාධ්‍යවේදයේ සමාජීය භරය හා එහි නියමානුකූලතාවන් වටහා ගනිමින් එයට විෂයමූලිකත්වයක් හා ඉහළ කාර්යක්ෂමතාවක් ලබා දෙන්නට ඔවුහු සමත් වූහ. "මේ නිසා සිය නිර්මාණ සමග සලකා බලන විට මාක්ස්ගේ හා එංගල්ස්ගේ ජනමාධ්‍යවේදීය නිර්මාණවලට අකාලික වූ වටිනාකමක් ප්‍රදානය කිරීමට ඔවුහු සමත් වූහ." සමකාලීන ජනමාධ්‍යවේදීය නිර්මාණ සමග සලකා බලන විට මාක්ස්ගේ හා එංගල්ස්ගේ ජනමාධ්‍යවේදීය නිර්මාණ පුළුල් පරිමාණික ස්වභාවයක් දරන්නා වූද නිශ්චිත න්‍යායික හා සමාජ විද්‍යාත්මක පදනමක් පිළිබිඹු කරන්නා වූද ශාස්ත්‍රාලීය ප්‍රවණතාවක් නියෝජනය කරන්නා වූ ද ප්‍රකාශන ලෙස සැලකිය හැකිය. නිදර්ශනයක් වශයෙන් මාක්ස් විසින් New Your Daily Tribune පුවත් පතට සැපයූ ලිපි මගින් සමකාලීන ධනේශ්වර සමාජය පිළිබඳව ඓතිහාසික වූද සමාජවිද්‍යාත්මක වූද සාර්වාංගික ගවේෂණයක් සිදු කොට ඇති බව සෝවියට් ඉතිහාසඥයෙකු වූ එන්. යූ. ස්සෙනන්කර් ප්‍රකාශ කරයි. "මෙය සාමාන්‍ය ප්‍රාදේශීය වාර්තාකරණය නොවන අතර නිශ්චිත පදනමක පිහිටා යුරෝපීය රටවල ආර්ථික හා දේශපාලන තත්ත්වය පිළිබඳව කියුණු අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස බිහිවන ලිපි මාලාවක් බව" මාක්ස්ගේ සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදයේ විශේෂතා පිළිබඳව සටහන් කරමින් එංගල්ස් ප්‍රකාශ කළේය.

මාක්ස් තම ජනමාධ්‍යවේදාත්මක ලිපි මගින් ඔහුගේ ඉතිහාසය හා සමාජය පිළිබඳ සංකල්පය වර්ධනය කළේය. නිශ්චිත දේශපාලන සහ ආර්ථික ගැටලු විශ්ලේෂණය කිරීමේ දී මාක්ස් ඓතිහාසික භෞතිකවාදී ක්‍රමවේදය භාවිතා කළේය. සමාජ සංවර්ධනය පිළිබඳ පොදු සංකල්පය සහ පංති අරගලය, පිළිබඳ න්‍යාය සමාජ - ආර්ථික හා දේශපාලනික ගැටලු විග්‍රහ කිරීමේ මාක්ස් ඉතාම විචක්ෂණ ලෙස භාවිතයට ගත්තේය.

කම්කරු ව්‍යාපාරය ධනපති පංතිය හා කම්කරු පංතිය අතර අරගලය, ධනේශ්වර ආ භාණ්ඩවල විදේශ ප්‍රතිපත්තිය, යටත් විජිත ප්‍රශ්නය ආදී ක්ෂේත්‍ර මාක්ස්ගේ ඉහත දක්වන ලද න්‍යායික හා සංකල්පිය ප්‍රවේශයන් ප්‍රකට කළ බවට නිදර්ශන වන්නේය. සමාජ පරිණාමයේ පදනම ලෙස ආර්ථික ඉතිහාසය මතු කර පෙන්වීම මාක්ස්ගේ ජනමාධ්‍යවේදිය නිර්මාණවලදී ප්‍රකට වන්නේය. "මා විසින් පුවත්පත්වලට සපයන ලද ලිපිවලින් විශාල කොටසක් නියෝජනය කළේ එංගලන්තයේ හා යුරෝපයේ සිදුවූ වැදගත් ආර්ථික සිදුවීම් පිළිබඳව වන අතර එය දේශපාලන ආර්ථික විද්‍යාව සම්බන්ධව සවිස්තරව කරුණු ගවේෂණය කිරීම කෙරෙහි මා තවත් පෙළඹුවේය."[10] මේ අනුව මාක්ස්ගේ ජනමාධ්‍යවේදිය හා සමාජ - දේශපාලනික භාවිතය පිළිබඳව අධ්‍යනය කරන විට විශේෂයෙන්ම 19 වන සියවසේ 50 - 60 දශකවලදී ඔවුන් විශේෂ අවධානය ආර්ථික ප්‍රශ්න කෙරෙහි යොමු වී තිබූ බව ප්‍රකාශ කළ හැකිය.

කාල් මාක්ස් සිය ජනමාධ්‍යවේදිය ලිපිවල භාවිත කරන ලද බොහෝ තොරතුරු, සාධක, දත්ත පසුකාලීනව සිය වැදගත්ම කෘතිය වන "ප්‍රාග්ධනය" ලිවීමේදී ප්‍රයෝජනයට ගත්තේය. විශේෂයෙන්ම New York Daily Tribune පුවත්පතට සපයන ලද ලිපි එහිදී විශේෂ වැදගත්කමක් ඉසිලීම, මාක්ස්ගේ ජනමාධ්‍යවේදිය ලිපිවල පළල් න්‍යායික ගැඹුර හා විද්‍යාත්මක සාධනය සාමාන්‍ය ජනමාධ්‍යවේදී භාවිතය අතික්‍රමණය කිරීමට සමත් වූ බව ධනේශ්වර ජනමාධ්‍යවේදීහු පවා අවධාරණය කළහ.



"මාක්ස් මහතා තමන්ගේ අතිශයින්ම නිශ්චිත දැක්ම දරන අතර අප ඒ සමඟ එතරම් එකඟ නොවූවත් නමුත් ඔහුගේ ලිපි නොකියවන්නෙකු සමකාලීන යුරෝපීය දේශපාලනයේ දැවැන්ත ගැටලු පිළිබඳ අති විශාල මූලාශ්‍රිත තොරතුරු ප්‍රමාණයක් අහිමි කරන්නේ ය."[11]

එංගල්ස්ගේ ජනමාධ්‍යවේදිය භාවිතයේ ප්‍රමාණික සහ ගැඹුරු විශේෂතා පරීක්ෂණය කළ හැකිය. නිශ්චිත පුළුල් සමාජ විද්‍යාත්මක පරාසයක පිහිටා විශ්ලේෂණය කිරීම එංගල්ස්ගේ ජනමාධ්‍යවේදිය භාවිතයේ ප්‍රකට ලක්ෂණයකි. තේමාමය බහුවිධත්වය, විශ්වාන්තර දැනුම එංගල්ස්ගේ ජනමාධ්‍යවේදිය භාවිතය තුළ ඉස්මතුව පෙනෙන අතර ඊට අමතරව දර්ශනවාදය, ජාත්‍යන්තර දේශපාලනය, යුද කලාව හා සම්බන්ධ ගැටලු පිළිබඳ එංගල්ස් සිය විශේෂ අවධානය යොමු කළේය. ඉතිහාසයේ හා ආර්ථිකයේ නිශ්චිත ගැටලු පිළිබඳව එංගල්ස් විශේෂ ලිපි සම්පාදනය කළේය. එංගල්ස් 19 වන සියවස 70 - 80 දශකවලදී ජර්මානු සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී ජනමාධ්‍ය සඳහා සම්පාදනය කරන ලද ලිපි මාලාව විද්‍යාත්මකභාවය, න්‍යායිකභාවය මැනවින් කැපී පෙනුණ අතර එමගින් මාක්ස්වාදී දර්ශනයේ හා කොමියුනිස්ට් න්‍යායේ සංකීර්ණ ගැටලු ගැඹුරු අර්ථකථනයකට ලක් කළේය. 1872 පෙබරවාරි මාසයේ සිට 1873 පෙබරවාරි මාසය දක්වා ජර්මානු - ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පතක් වූ "Volksstaat" හි පුරුදින් හා මුල්බර්ගර් සමග එංගල්ස් විශාල සංවාදයක් කළ අතර එය පසු කාලීනව "නිවාස ප්‍රශ්නය" මැයෙන් කෘතියක් වශයෙන් පළ විය.

එසේම 1877 ජනවාරි මාසයේ සිට 1878 ජූනි මාසය දක්වා ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පුවත්පත වූ "Volwarts" හි එංගල්ස්ගේ ලිපි පෙළක් පළ කළේය. එම ලිපි පෙළ මූලික වශයෙන් යොමුව පැවතියේ ජර්මානු සුළු ධනේශ්වර දාර්ශනිකයෙකු, සාරසංග්‍රාවාදියෙකු හා ග්‍රාම්‍ය ආර්ථික විද්‍යාඥයෙකු වූ ඩියුරින්ට එරෙහිවය.

[10] කාල් මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස්, එකතුකළ සම්පූර්ණ කෘති, වෙළුම 13 පිටුව 9
[11] New - York Daily Tribune 6v.1853

"එච්ගෙනි ඩියුරින් විද්‍යාව තුළ සිදුකළ පෙරළිය' දාර්ශනිකයකු දේශපාලන ආර්ථික විද්‍යාව, සමාජවාදය" - මැයෙන් 1878 දී එම ලිපි පෙළ කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

මානව සංහතියේ යුද කලාව සහ එහි ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී එංගල්ස් ඉතා දක්ෂ ලෙස භෞතිකවාදී ක්‍රමවේදීය යොදා ගන්නා ලදි. ලෝකය පිළිබඳ අපෝහක භෞතිකවාදී සංකල්පයට අනුව නව නිර්ධන පංතික ජනමාධ්‍යවේදයේ මූලික ගති ලක්ෂණ පෙන්වා දුන්නේ ය. සමකාලීන නිර්මාක්ස්වාදීන් හා ධනේශ්වර දෘෂ්ටිවාදීන් මාක්ස්ගේ හා එංගල්ස්ගේ ජනමාධ්‍යවේදාත්මක නිර්මාණවල අන්තර්ගත අසාමාන්‍ය උසස් මට්ටම පිළිබඳ ඉහළ ඇගයීමක් කොට තිබේ.

ජනමාධ්‍යවේදය පිළිබඳව මාක්ස්වාදී සංකලපයේ වර්ධනය දීර්ඝකාලීන ඓතිහාසික ක්‍රියාවලියකි. ජර්මනියේ හා වෙනත් යුරෝපීය රටවල විප්ලවීය කම්කරු ව්‍යාපාරයේ වර්ධනයටත්, නිර්ධන පංතික ජනමාධ්‍ය ස්ථාපිත වීමටත්, මාක්ස්වාදී න්‍යාය හැඩගැස්ම හා වර්ධනය වීමත්, සමපාතව මාක්ස්වාදී ජනමාධ්‍යවේදීය න්‍යාය ගොඩනැගුණ බව අවධාරණය කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. කාල් මාක්ස් ෆ්‍රෙඩ්රික් එංගල්ස් එකතු කළ සම්පූර්ණ කෘති වෙළු 03
2. එම කෘති වෙළුම 13
3. එම කෘති වෙළුම 21
4. එම කෘති වෙළුම 27
5. වී. අයි. ලෙනින් සම්පූර්ණ කෘති එකතුව වෙළුම 18
6. එම, කෘති වෙළුම 25
7. එම, කෘති වෙළුම 26
8. Fmering, Karl Marx, History of this life, Moscow, 1957
9. New York Daily tribune. 6v, 1853